# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2024.12.20 |

# පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.)[1] - 2023


## 2023 වසරේ දී ද බස්නාහිර පළාත ආර්ථිකයට ප්‍රධානම දායකත්වය ලබා දී ඇති අතර, පසුගිය වසරට සාපේක්ෂව ප්‍රතිශතාත්මකව සුළු අඩු වීමක් වාර්තා වී ඇත.

2023 වසරේ ශ්‍රී ලංකාවේ නාමික දළ දේශීය නිෂ්පාදිතය සඳහා ඉහළම දායකත්වය (සියයට 43.7) බස්නාහිර පළාත විසින් ලබා දී ඇත. කෙසේ වුවද, එම දායකත්වය පෙර වසර හා සසඳන විට සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. බස්නාහිර පළාතේ මෙම ඉහළ දායකත්වය විශේෂයෙන්ම සේවා සහ කර්මාන්ත අංශ තුළ කැපී පෙනුණි. තවද, සමස්ත ද.දේ.නි. සඳහා දෙවන සහ තෙවන ඉහළම දායකත්ව අනුපිළිවෙළින් වයඹ (සියයට 10.9) සහ මධ්‍යම (සියයට 10.3) පළාත් විසින් ලබාදෙන ලදී.

නාමික ද.දේ.නි.ට මධ්‍යම, උතුරු මැද, උතුරු හා දකුණු පළාත්වලින් දක්වන ලද දායකත්ව 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී ඉහළ ගියේය. තවද, පෙර වසරට සාපේක්ෂව අඩු වේගයකින් වුවද සියලුම පළාත්වල නාමික දළ දේශීය නිෂ්පාදිතය 2023 වසරේ දී වර්ධනය වී ඇත.

| විශේෂ කරුණු | |
|---|---|
| *නාමික ද.දේ.නි. – 2023* | |
| *රු. බිලියන 27,630* | |
| *ප.ද.දේ.නි. දායකත්වය:* | |
| *පළමු* | බස්නාහිර පළාත **43.7%** |
| *දෙවන* | වයඹ පළාත **10.9%** |
| *තෙවන* | මධ්‍යම පළාත **10.3%** |

රූප සටහන 1
පළාත් අනුව ද.දේ.නි. දායකත්වය (%) - 2023





## ආර්ථික කටයුතු සඳහා පළාත් මගින් දායකත්වය[2]

කෘෂිකාර්මික කටයුතුවල දී වයඹ පළාත තවදුරටත් ඉහළම දායකත්වය (සියයට 19.6) ලබා දී ඇති අතර, දකුණු (සියයට 13.5) සහ මධ්‍යම (සියයට 12.4) පළාත් පිළිවෙළින් දෙවන සහ තෙවන ඉහළම දායකත්ව ලබා දී ඇත.

මේ අතර, 2023 වසරේ දී කර්මාන්ත ක්‍රියාකාරකම්වල සිය ප්‍රමුඛ දායකත්වය තවදුරටත් තහවුරු කළ බස්නාහිර පළාත (සියයට 48.7), සමස්ත කර්මාන්ත නිමැවුමෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් සඳහා දායක විය. එසේම, වයඹ (සියයට 12.3) සහ මධ්‍යම (සියයට 9.3) පළාත් සමස්ත කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා ඊලඟ ඉහළම දායකත්ව වාර්තා කර ඇත.

සේවා අංශයේ ක්‍රියාකාරීත්වය සලකන විට, බස්නාහිර පළාත සිය ප්‍රමුඛතාව 2023 වසරේදී ද රඳවාගනිමින් සියයට 45.9ක දායකත්වයක් වාර්තා කර ඇති අතර, ඉන්පසු මධ්‍යම පළාත සියයට 10.4ක දායකත්වයක් සහ දකුණු පළාත සියයට 9.9ක දායකත්වයක් වාර්තා කර ඇත.

රූප සටහන 2
පළාත් අනුව ආර්ථික කටයුතුවල දායකත්වය (%) - 2023




[1] 2015 පදනම් වර්ෂය යටතේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද නාමික (පවත්නා වෙළඳපොළ මිල අනුව) දළ දේශීය නිෂ්පාදිතය පළාත් අනුව බෙදා වෙන්කර ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ප.ද.දේ.නි. ඇස්තමේන්තු කර ඇත. මෙහිදී ද.දේ.නි. හා සම්බන්ධ එක් එක් අයිතමවල අගයන් පළාත් මට්ටමෙන් සකස්කරගත් දර්ශක පදනම්කොට එක් එක් පළාත් සඳහා බෙදා හැරීම කර ඇත.

[2] 2022 සහ 2023 පළාත් සඳහා ආංශික සැසඳීම් මෙම නිකුතුවේ ඇමුණුමේ දක්වා ඇත.

## සංඛ්‍යා සටහන 1
## පවත්නා වෙළඳපොළ මිල අනුව පළාත් ද.දේ.නි. (පදනම් වර්ෂය 2015)

| පළාත | 2022(අ) | | 2023(ආ) | |
|---|---|---|---|---|
| | අගය (රු. මිලියන) | ප්‍රතිශතය (%) | අගය (රු. මිලියන) | ප්‍රතිශතය (%) |
| මධ්‍යම | 2,414,274 | 10.0 | 2,844,197 | 10.3 |
| නැගෙනහිර | 1,225,527 | 5.1 | 1,298,136 | 4.7 |
| උතුරු මැද | 1,151,135 | 4.8 | 1,329,760 | 4.8 |
| වයඹ | 2,672,598 | 11.1 | 3,016,741 | 10.9 |
| උතුරු | 974,521 | 4.0 | 1,245,665 | 4.5 |
| සබරගමුව | 1,722,635 | 7.2 | 1,939,907 | 7.0 |
| දකුණු | 2,176,034 | 9.0 | 2,580,739 | 9.3 |
| ඌව | 1,161,566 | 4.8 | 1,300,538 | 4.7 |
| බස්නාහිර | 10,565,473 | 43.9 | 12,073,982 | 43.7 |
| **ශ්‍රී ලංකාව** | **24,063,762** | **100.0** | **27,629,665** | **100.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

*මූලයන්:* ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සංඛ්‍යා සටහන 2
## පළාත් අනුව දළ එකතුකළ අගයෙහි ආංශික සංයුතිය (පවත්නා වෙළඳපොළ මිල අනුව)

| පළාත | කෘෂිකර්මාන්ත (%) | | කර්මාන්ත (%) | | සේවා (%) | |
|---|---|---|---|---|---|---|
| | 2022(අ) | 2023(ආ) | 2022(අ) | 2023(ආ) | 2022(අ) | 2023(ආ) |
| මධ්‍යම | 14.5 | 12.4 | 8.7 | 9.3 | 10.1 | 10.4 |
| නැගෙනහිර | 9.5 | 9.4 | 4.3 | 3.5 | 4.8 | 4.6 |
| උතුරු මැද | 7.6 | 8.4 | 4.2 | 3.7 | 4.7 | 4.8 |
| වයඹ | 18.5 | 19.6 | 11.6 | 12.3 | 9.8 | 9.1 |
| උතුරු | 6.1 | 8.4 | 4.3 | 4.8 | 3.6 | 3.9 |
| සබරගමුව | 8.8 | 7.7 | 6.7 | 7.3 | 7.1 | 6.8 |
| දකුණු | 14.5 | 13.5 | 6.3 | 6.7 | 9.6 | 9.9 |
| ඌව | 8.8 | 8.5 | 4.0 | 3.6 | 4.7 | 4.6 |
| බස්නාහිර | 11.7 | 12.1 | 49.9 | 48.7 | 45.6 | 45.9 |
| **ශ්‍රී ලංකාව** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

*මූලයන්:* ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සංඛ්‍යා සටහන 3
## පළාත් තුළ දළ එකතුකළ අගයෙහි ආංශික සංයුතිය (පවත්නා වෙළඳපොළ මිල අනුව)

| පළාත | 2022(අ) | | | | 2023(ආ) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කෘෂිකර්මාන්ත (%) | කර්මාන්ත (%) | සේවා (%) | දළ එකතුකළ අගය (%) | කෘෂිකර්මාන්ත (%) | කර්මාන්ත (%) | සේවා (%) | දළ එකතුකළ අගය (%) |
| මධ්‍යම | 12.9 | 27.2 | 59.9 | 100.0 | 10.7 | 24.7 | 64.6 | 100.0 |
| නැගෙනහිර | 16.6 | 26.5 | 56.9 | 100.0 | 17.7 | 20.2 | 62.2 | 100.0 |
| උතුරු මැද | 14.1 | 27.2 | 58.7 | 100.0 | 15.4 | 21.1 | 63.5 | 100.0 |
| වයඹ | 14.9 | 32.6 | 52.5 | 100.0 | 15.9 | 30.9 | 53.3 | 100.0 |
| උතුරු | 13.4 | 33.0 | 53.7 | 100.0 | 16.4 | 29.0 | 54.7 | 100.0 |
| සබරගමුව | 10.9 | 29.4 | 59.7 | 100.0 | 9.7 | 28.3 | 62.1 | 100.0 |
| දකුණු | 14.3 | 21.9 | 63.8 | 100.0 | 12.8 | 19.6 | 67.6 | 100.0 |
| ඌව | 16.3 | 25.7 | 57.9 | 100.0 | 16.0 | 21.0 | 63.0 | 100.0 |
| බස්නාහිර | 2.4 | 35.6 | 62.1 | 100.0 | 2.4 | 30.4 | 67.1 | 100.0 |
| **ශ්‍රී ලංකාව** | **8.9** | **31.3** | **59.8** | **100.0** | **8.8** | **27.3** | **63.9** | **100.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

*මූලයන්:* ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව